# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2336/45 - 2023 ජූනි මස 14 වැනි බදාදා - 2023.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය, 6 වන වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 ජූනි මස 14 වැනි දින,
කොළඹ 01,
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2023 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙමගින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

3. ඉහත සඳහන් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල **I වන උපලේඛනයට** පහත සඳහන් භාණ්ඩ හා ඒවාට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

1A - PG 6367 — 376 (2023/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | *I තීරුව*<br><br>***ශීර්ෂ අංකය*** | *II තීරුව*<br><br>***සංයෝජිත වර්ගීකරණ සංකේතය*** | | *III තීරුව*<br><br>***විස්තරය*** | *IV තීරුව*<br><br>***ආනයන පාලන බලපත්‍රය (ICL)*** |
|---|---|---|---|---|---|
| 239 | **11.01** | | | **තිරිඟු හෝ මෙස්ලින් පිටි** | |
| | | 1101.00.10 | --- | තිරිඟු වලින් | **L** |

4. ඉහත රෙගුලාසි අංක 3හි කෙසේ සඳහන් වුවද, පහත සඳහන් අවස්ථාවලදී එහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ, ආනයන පාලන බලපත්‍රයකට (ICL) යටත්ව රේගු නිශ්කාශනයට අවසර දෙනු ලැබේ;

(අ) නැව් / ගුවන් ගත කළ දිනය, 2023 ජුනි මස 14 වැනි දින හෝ ඊට පෙර දිනයක් සහිත සහ 2023 ජුනි මස 30 දින හෝ ඊට පෙර මෙරටට ලඟා වූ භාණ්ඩ.

(ආ) 2023 ජුනි මස 14 වැනි දින හෝ ඊට පෙර ස්ථාපනය කරන ලද ණයවර ලිපියක් (LC) මත පදනම්ව ආනයනය කරනු ලබන, *ගැසට් පත්‍රය* ප්‍රකාශයට පත් කළ දින සිට දින 60ක් ඇතුළත මෙරටට ලඟා වූ භාණ්ඩ.

(ඇ) 2023 ජුනි මස 14 වැනි දින හෝ ඊට පෙර සිදු කරන ලද අත්තිකාරම් ගෙවීමක් මත පදනම්ව ආනයනය කරනු ලබන, *ගැසට් පත්‍රය* ප්‍රකාශයට පත් කළ දින සිට දින 60ක් ඇතුළත මෙරටට ලඟා වූ භාණ්ඩ.

5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට, බලපත්‍රලාභී බැංකුවලට හෝ වෙනත් ඕනෑම අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

6. මෙම රෙගුලාසි සම්බන්ධව පැන නගින ඕනෑම ගැටලුවක් සම්බන්ධයෙන් වන අවසාන තීරණය ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ගනු ලැබේ.

7. සංශෝධිත, විශේෂ ආනයන හා අපනයන පාලන බලපත්‍ර ගාස්තු පළකරන ලද 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* **I** වන උපලේඛනයට, පහත සඳහන් අයිතම සඳහා ගෙවිය යුතු ආනයන පාලන බලපත්‍ර ගාස්තු මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| *අනු අංකය* | *භාණ්ඩය* | *ආනයන පාලන බලපත්‍ර ගාස්තුව* |
|---|---|---|
| 88 | තිරිඟු පිටි | මි. ර. ගැ. වටිනාකමින් 0.1% |

EOG 06 - 0181

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.